# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 26 දරන අඹගහපැලැස්ස ශ්‍රී සංඝබෝධි ශාසනෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 ජූලි මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 ජූලි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1993 අංක 26 දරන අඹගහපැලැස්ස ශ්‍රී සංඝබෝධි ශාසනෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1993 ජූලි මස 16 වන දින]

එල්. ඩී.—ඕ. 72/88

**අඹගහපැලැස්ස ශ්‍රී සංඝබෝධි ශාසනෝදය සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"අඹගහපැලැස්ස ශ්‍රී සංඝබෝධි ශාසනෝදය සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ සංගමයට සම්බන්ධ සියලු කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා කරගෙනයාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ අඹගහපැලැස්සෙහි මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින්ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1993 අංක 26 දරන අඹගහපැලැස්ස ශ්‍රී සංඝබෝධි ශාසනෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අඹගහපැලැස්ස ශ්‍රී සංඝබෝධි ශාසනෝදය සමිතිය සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භවීමේ දින සිට සහ ඉන්පසු (මෙහි මින්මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) "අඹගහපැලැස්ස ශ්‍රී සංඝබෝධි ශාසනෝදය සමිතියේ" දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින්මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් "අඹගහපැලැස්ස ශ්‍රී සංඝබෝධි ශාසනෝදය සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තව ද, එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ජනතාව අතර ආගමික දැනුම බෙදා දීම සහ පැතිරවීම ;

(ආ) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීම, පාලනය කිරීම හා පවත්වාගෙන යාම ;

(ඇ) ජනතාවගේ අධ්‍යාත්මික ගුණවත්භාව වැඩිදියුණු කිරීම ;

(ඇ) බෞද්ධ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සහ නංවාලීම ;

(ඈ) සමාජ සහ ආර්ථික සුභ සිද්ධියට හිතකර කටයුතුවල නිරතවීම ;

(ඉ) සිරිසඟබෝ පිරිවෙන සහ ඊට අනුබද්ධ වෙනත් පිරිවෙන් පාලනය කිරීමෙන් සහ පවත්වා ගෙනයාමෙන් අධ්‍යාපනය නංවාලීම ; සහ

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කිරීමට හිතකර හෝ ආනුෂංගික වෙනත් ක්‍රියා සහ දේවල් කිරීම.

**සංස්ථාවේ කාර්‍යභාර බලතල.**

4. සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද, බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ හිතකර කවරාකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කාරණා ඉටුකිරීමේ ද දේවල් ක්‍රියාත්මක කිරීමේ ද බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි සහ එකී රීතිවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නිලධරයන්ගෙන් සහ වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින් එකී රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සමිතියේ විධායක කාරක සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

**සංස්ථාවේ රීති.**

6. (1) පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ සිටින සහ ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන් ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් ඇතුලත් කර ගැනීම, වර්ග කිරීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් නෙරපීම සහ ඔවුන්ගේ සාමාජික ගාස්තු ;

(ආ) විධායක කාරක සභාවට සහ අනුකාරක සභාවලට සාමාජික යින් තෝරා පත් කර ගැනීමේ ක්‍රමය එකී සාමාජිකයන් ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, හැසිරීම සහ කාර්ය ;

(ඇ) සංස්ථාවේ නිල දරන්නන්, නිලධරයන් සහ සේවකයන් තෝරා පත් කර ගැනීම හෝ පත්කිරීම සහ ඔවුන්ගේ බලතල, හැසිරීම කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ විධායක කාරක සභාවේ සහ විවිධ අනුකාරක සභාවල රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගම නය කළ යුතු කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම් පැවැත්විය යුතු වේලාවන්, ස්ථාන සහ ඒ රැස්වීම්වල නිවේදන සහ න්‍යාය පත්‍ර සහ ඒ රැස්වීම්වල ගණපූරණය හා ඒවායේදී කළ යුතු කටයුතු ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස් ථාවේ ගිණුම් පවත්වාගෙන යෑම සහ විගණනය කිරීම ; සහ

(ඊ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත් විය යුත්තාහ.

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්ත මේන්තු බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස් ථාව වෙත සතු කරනු ලබන චංචල හෝ නිශ්චල හෝ යම් දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීතිය අනුව බලය හා ශක්තතාව සංස්ථාවට ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් තිබීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ සම්පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීති වලට යටත්ව, සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිම හැකි බව.

8. මේ පනතේ කාර්ය සඳහා මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරතුවම වූ දිනයේදී පැවති සමිතියේ සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සමිතියට අයවිය යුතු සියලු ණය සහ සමිති යට ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. සමිතිය විසින් ගෙවිය යුතු හා සමිතියට එදිනට අයවිය යුතු ණය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. තත් කාර්ය සඳහා විධායක කාරක සභාව විසින් කලින් කල බලය දෙනු ලබන තැනැත්තන් ඉදිරිපිටදී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි ඔවුන් විසින් තම නම් අත්සන් කළ යුතු ය. තවද, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවූවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය